**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 14 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,942.68 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,575.84 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 366.84 ක් හෙවත් සියයට 5.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 5,488.03 | 5,352.67 | 135.36 | 2.47 |
| මූලධන | 1,454.65 | 1,223.18 | 231.47 | 15.91 |
| එකතුව | 6,942.68 | 6,575.85 | 366.83 | 5.28 |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 400.00 | 377.94 | 230.00 | 279.05 | 1,200.00 | 984.23 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/000/00328/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 178.2 ක් විය.

## 2.4 තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 8,594.05 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0094/000 | 5,997.53 |
| 6000/0000/00/0002/0128/000 | 12.69 |
| 6000/0000/00/0013/0085/000 | 2,120.82 |
| 6000/000/00/0014/0015/000 | 365.28 |
| 6000/0000/00/0016/0077/000 | 97.73 |
| | 8,594.05 |

## 2.5 විගණන නිරීක්ෂණය

අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා තිබුණු බව තහවුරුකර ගැනීමට ලිඛිත සාක්ෂි නොතිබුණු අතර ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා තිබුණු බව තහවුරු කර ගැනීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ ලැයිස්තුවේ එකතුව අතර රු.12,259,540 ක පැහැදිලි නොකළ වෙනසක් තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.23,346,657 ක්වූ අතර එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 30 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව යටතේ ඇති උසාවි 189 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 ජුනි 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2015 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.4** **අනුකූල නොවීම**

**නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 94 | 7,454,359 | වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 115(3) | 72,079 | 2016 වර්ෂයට අදාළ වියදම් 2017 වර්ෂයේදී ගෙවීම සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 115 (4) | 164,110 | 2014 වර්ෂයේ හෝමාගම අධිකරණ සංකීර්ණයට මුල් ගල තැබීමේ උත්සව වියදම් 2017 ජනවාරි 03 දින ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෙත ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3.5** **විදේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් හා ව්‍යාපෘති කළමනාකරණ දුර්වලතා පිළිබඳ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) ඉකුත් වර්ෂ 03 තුළදී ක්‍රියාත්මක කර තිබුණු එකතු වටිනාකම රු.මිලියන 447.35 ක් වූ සුළු පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති 26 කින් ව්‍යාපෘති 21 කට අදාළ ගිවිසුම් ප්‍රකාරව, වැඩ අවසන් කළයුතු නියමිත දිනට වැඩ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය වර්ෂයකට වඩා වැඩි විය.

(ii) 2013 මාර්තු 01 දින වත්තල අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 194.11 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2014 පෙබරවාරි 28 දින වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කළයුතු විය. නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට අවස්ථා 06 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණු නමුත් එදිනට මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 131.91 ක් පමණක් විය.

**3.6** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 386 | 425 | - | 39 |
| (ii) | තෘතියික මට්ටම | 445 | 253 | 192 | - |
| (iii) | ද්විතියික මට්ටම | 5,351 | 4,310 | 1,041 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,121 | 3,834 | 287 | - |
| | **එකතුව** | **10,303** | **8,822** | **1,520** | **39** |